# උත්ථාන සමයේ පස්වන සතිය
# බදාදා

## පළමුවන කියැවීම

අපෝස්තුළුවරුන්ගේ ක්‍රියා පොතෙන් ගත් පාඨයෙකි.

ක්‍රියා 15 : 1–6

**“මෝසෙස්ගේ නීතිය ගැන ප්‍රශ්නයක් මතුවේ.”**

ජුදයෙන් සමහර දෙනෙක් අවුත්, “මෝසෙස්ගෙන් පැවත එන සිරිත ලෙස ඔබ චර්මඡේදනය කරනු නොලැබුවහොත් ඔබට ගැළවීම ලැබිය නොහැකිය” යි සහෝදරයන්ට ඉගැන්වූහ. එහෙයින් ඔවුන් ද පාවුලු හා බර්ණබස් ද අතර වේගවත් වාද විවාද ඇති විය. මේ ප්‍රශ්නය ගැන අපෝස්තුළුවරුන් සහ සභා මූලිකයන්ගෙන් විචාරණ පිණිස පාවුලු සහ බර්ණබස් ද අන්තියෝකියෙන් තවත් සමහරෙක් ද ජෙරුසලමට යැවීමට නියම කරනු ලැබූහ. මෙසේ ඔව්හු සභාව විසින් යවනු ලදුව පෙනිකිය ද සමාරිය ද මැදින් ගොස් විජාතීන්ගේ හැරීම ප්‍රකාශ කරමින්, සියලු සහෝදරයන්ට මහත් ප්‍රීතියක් ගෙන දුන්හ. ඔවුන් ජෙරුසලමට පැමිණි කල සභාව ද, අපෝස්තුළුවරු ද සභා මූලිකයෝ ද ඔවුන් පිළිගත්හ. ඉන්පසු ඔවුහු දෙවියන් වහන්සේ තමන් ලවා ඉටු කරවූ සියලු දේ ඔවුන්ට දැන්වූහ. එවිට පරිසිවරුන්ගේ ඇදහිල්ලට අයත් සමහරෙක් නැගිට,

“චර්මඡේදනය කරන්නටත් මෝසෙස්ගේ ව්‍යවස්ථාව පිළිපදින්නටත් ඔවුනට නියම කළයුතුය” යි කීහ. අපෝස්තුළුවරු ද සභා මූලිකයෝ ද මේ කාරණය ගැන කල්පනා කර බලන පිණිස රැස්වූහ.

දේව වාක්‍යය එසේය.

## පිළිතුරු ගීය

**ගීතාවලිය** **122 : 1-5**

පිළිතුර: 'දෙව්මැදුරට යමු' යි ඔවුන් කී විට මම ප්‍රීතියෙන් පිනා ගියෙමි.

ගීය:

"දෙව්මැදුරට යමු" යි ඔවුන් කී විට මම ප්‍රීතියෙන් පිනා ගියෙමි.
එම්බා ජෙරුසලම අපේ දෙපා තීගේ වාසල ඇතුළේ තබා තිබේ.

එම්බා ජෙරුසලම මැනවින් සාදා නිම කළ නුවරක් මෙන් තී ගොඩ නගන ලද්දිය. ඉශ්රායෙල් සෙනඟට නියම කළ ලෙස ගෝත්‍රයෝ, සමිඳුන්ගේ ගෝත්‍රයෝ එතුමන් නමට තුති දෙන පිණිස මෙම නගරය වෙත පැමිණෙති.

මන්ද, සිංහාසනය, එනම් දාවිත්ගේ සිංහාසනය සෙනඟ විනිශ්චය කරන පිණිස එහි පිහිටා තිබේ.

## සාධුකාරය

ආලේලූයා! ආලේලූයා!
"මාගේ බැටළුවෝ මාගේ කටහඬ අසති. මම ද ඔවුන් අඳුනමි.
ඔවුහු ද මා පසු පස්සේ එතියි" ස්වාමින් වහන්සේ වදාරණ සේක.
ආලේලූයා!

# සුවිශේෂය

සුවිශේෂක ජුවාම්තුමන් විසින් ලියන ලද දේව වාක්‍යය නම් මෙසේය.

ජුවාම් 15 : 1–8

**"යමෙක් මා තුළ වසත් ද, මම ඔහු තුළ වැඩ සිටිම් ද ඔහු බොහෝ පල දරයි."**

"සැබෑ මිදි වැල මම ය. මාගේ පියාණන් වහන්සේ උද්‍යාන පාලකයාණෝය. උන්වහන්සේ මා තුළ ඇති, පල නොදරන සියලු අතු කපා හරින සේක. පල දරන සියලු අතු වඩා පල දරන පිණිස පාහින සේක. මා ඔබට වදාළ දහම කරණකොටගෙන ඔබ දැනටම පිරිසිදුය. මා තුළ සිටින්න. මම ද ඔබ තුළ සිටිමි. අත්ත මිදිවැල ට යාව් නැත්නම් වෙන්ව පල දරන්නට ඊට නොහැකි සේ, ඔබ මා හා ඒකාබද්ධ නොවන්නහු නම්, පල දැරීමට ඔබට නොහැකිය"

'මිදිවැල මම ය. ඔබ අතුය. යමෙක් මා තුළ සිටින්නේ ද, මම ඔහු තුළ සිටිම් ද, ඒ තැනැත්තේ බොහෝ පල දරයි. මන්ද, මාගෙන් වෙන්ව කිසිවක් කරන්නට ඔබට නොහැකිය. යම් තැනැත්තෙක් මා තුළ නොසිටින්නේ නම් ඔහු අත්තක් මෙන් පිටත දමනු ලැබ වියළී යයි. වියළි අතු එක්රැස් කොට ගින්නට දමනු ලැබේ. ඒවා දැවී යන්නේය. ඔබ මා තුළ සිටින්නහු නම් මාගේ වචන ඔබ තුළ පවතී නම් ඔබ කැමැති දෙයක් අයදින්න. එය ඔබට දෙනු ලැබේ. මාගේ පියාණන් වහන්සේ මහිමයට පමුණුවනු ලබන්නේ ඔබ බොහෝ සේ පල දරමින් මාගේ ගෝලයන් වීමෙන් ය.

සුවිශේෂ වාක්‍යය එසේය.